ලෝක ව්‍යාප්ත වසංගතයක් ලෙසින් හඳුනාගත හැකි කොවිඩ්-19 හා සටන් වැදීමේදී වැදගත් වන සුවිශේෂී කරුණක් වන්නේ, කොවිඩ්-19 ආසාදිතයන් හා ආශ්‍රිතයන් පිළිබඳව සමාජය තුළ කොන් කිරීමේ ආකල්පයක් හෝ ගර්හාවක් ඇති වීම වැළැක්වීමයි. ඒ සඳහා මාධ්‍ය විසින් කොවිඩ්-19 ආසාදිතයින් පිළිබඳව සඳහන් කිරීමේදී භාවිතා කෙරෙනා භාෂාව වැදගත් වේ. මෙනිසා, කොවිඩ්-19 ආසාදිතයන් සම්බන්ධයෙන් වාර්තාකරණයේදී යොදාගැනීමට යෝග්‍ය නොවන සහ යෝග්‍ය වන යෙදුම් ලෝක සෞඛ්‍ය සංවිධානයෙන් සහ වෙනත් පාර්ශවයන් මගින් හඳුන්වා දී ඇති මාර්ගෝපදේශනයන් තුළ දැක්වී ඇත.

කෙසේ නමුත් නොදැනුවත් භාවය නිසාවෙන් හෝ ඇතැම් මාධ්‍ය එම අයෝග්‍ය යෙදුම් කොවිඩ්-19 ආසාදිතයින් සම්බන්ධයෙන් භාවිතා කෙරෙනු අපට දැකිය හැක. උදාහරණ ලෙසින් Daily Mirror පුවත් වාර්තාවන් (නොවැම්බර් 11, 23, 24) තුළ Covid-19 victims සහ Covid-19 Cases යනුවෙන් සඳහන්ව තිබීම දැක්විය හැක.

එනිසා, කොවිඩ්-19 ආසාදිතයන් කෙරෙහි සමාජ කොන් කිරීමක් ඇතිවීම වැළැක්වීම සඳහා තමන් භාවිතා කරනා යෙදුම් පිළිබඳව විශේෂයෙන් සැලකිලිමත් වන ලෙසින් සහ ආචාර ධාර්මික වාර්තාකරණයක යෙදෙන ලෙසින් අපි නැවතත් අවධාරණය කරමු.


මූලාශ්‍ර:
https://www.who.int/docs/default-source/coronaviruse/covid19-stigma-guide.pdf
https://erj.ersjournals.com/content/early/2020/06/25/13993003.02461-2020?fbclid=IwAR0lgl7wHPBGAW79HEQrWJWovuY3sCzxHF5dKu0mnhBAl_EeOWKmgPjNR-w


#MediaEthicsSL #lka #EnglishPress #DailyMirror